දේශපාලන

# විවරණ

2018 ජූනි


# 20වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

කුමක්ද?

කා සඳහාද?

කුමන බලපෑමක් ඇති කරයිද?

**ජනතා විමුක්ති පෙරමුණ**



“ප්‍රජාතාන්ත්‍රික ජනතාවකට ව්‍යවස්ථාදායක
සභාව පිළිබඳව සදාචාරාත්මක ලෙස
බලපෑම් කිරීමට පවතින අයිතිය පැරණි
විප්ලවීය අයිතියකි; එය ඉංග්‍රීසි සහ ප්‍රංශ
විප්ලවයන්ගේ සිටම සියලු බාධාකාරී
තත්වයන් යටතේ තවමත් යුක්තිය ඉටු
නොවූ අයිතියකි. ඉතිහාසය විසින් වැයකළ
සියලු ශක්තීන් මෙම අයිතිය සඳහා ගත්
පියවරයන්ය.”

**කාල් මාක්ස්**

## 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියන්නේ මොකක්ද?

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයා සතු වන බලතල සංශෝධනය කිරීමට ඉදිරිපත් කෙරෙන යෝජනාවකි. ජනතා විමුක්ති පෙරමුණේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් වශයෙන් මෙය පාර්ලිමේන්තුව හමුවේ ඉදිරිපත් කොට තිබේ. ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිධුරය සතුව පවතින හිතුවක්කාරී ලෙස හැසිරීමට පොළඹවන බලතල සීමා කිරීමට නව සංශෝධනය මගින් යෝජනාවන් ඉදිරිපත් කෙරේ.

ජනරජයේ නීතිය ක්‍රියාත්මක කරවීමේ බලය නැතිනම් "විධායක බලය" හිමි වන්නේ ජනාධිපතිවරයාටය. 20වන සංශෝධනය මගින් ජනාධිපතිවරයාට නීතිය ක්‍රියාත්මක කිරීමේදී එය වඩාත් වගකීම් සහිතව සහ වගවීමකින් යුක්තව ඉටුකිරීමට හැකි වන පරිදි වඩාත් ජනතාවාදී ආකාරයට සංශෝධනය කිරීමට යෝජනා කෙරේ.

## 20වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් යෝජිත වෙනස්කම් මොනවාද?

20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිධුරය සතුවිය යුතු බලතල හා එම ධුරයේ ස්වභාවය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට යෝජනා වී තිබේ.

1. තව දුරටත් ජනාධිපතිවරයා රාජ්‍යයේ ප්‍රධානියාද, විධායකයේ ප්‍රධානියාද, සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයාද වනු ඇත. (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 3 i වගන්තිය)
2. මෙහිදී විධායක බලය ඉතා පැහැදිලි ලෙස ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ජනාධිපතිවරයා සහ කැබිනට් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතු බවට යෝජනා වේ. (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 3 i වගන්තිය)
3. ආණ්ඩුවේ ප්‍රධානියා වන්නේ අග්‍රාමාත්‍යවරයාය. (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 14 i වගන්තිය)
4. පාර්ලිමේන්තුව පත්වීමෙන් මසක් ඇතුළත පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිධුරය සඳහා මෙරට පුරවැසියෙකු වන

සුදුසුකම් ලත් ඕනෑම අයෙකු පත්කර ගැනීමට නියමිතය. එසේ ජනාධිපතිවරයා වශයෙන් තේරී පත්වන පුද්ගලයාට ජනාධිපතිධුරය දරන කාලය තුළ කිසිදු දේශපාලන පක්ෂයක තනතුරක් හෝ වගකීමක් හෝ සාමාජිකත්වය දැරිය නොහැක. ජනාධිපතිවරයා නිර්පාක්ෂික විය යුතුය. (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 3 **v** වගන්තිය)

5. ජනාධිපතිවරයාගේ ධුර කාලය සාමාන්‍යයෙන් අවුරුදු 5කි. (පාර්ලිමේන්තුවේ ධුර කාලයට සමාන වේ) (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 3 **iv** වගන්තිය)

6. පාර්ලිමේන්තුව විසුරුවනු ලැබුවහොත් ඊළඟ ජනාධිපතිවරයා පත්වන තෙක් ධුරය දරයි. (රට අස්ථාවර වීමක් සිදු නොවේ.) (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 3 **iv** වගන්තිය)

7. ඊළඟ පාර්ලිමේන්තුව විසින් නව ජනාධිපතිවරයෙකු පත්කරගත් වහාම එතෙක් සිටි ජනාධිපතිවරයාගේ ධුර කාලය අවසන් වේ. (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 3 **iv** වගන්තිය)

8. පාර්ලිමේන්තුව සිය පළමු සැසි වාරයේ සිට සති 4ක කාලයක් තුළ රහසිගත ඡන්දයක් මගින් (පැමිණ නොසිටින මන්ත්‍රීවරුන්ද ඇතුළත්ව) මන්ත්‍රීවරුන්ගේ සාමාන්‍ය බහුතරයෙන් ජනාධිපතිවරයා තෝරා පත්කර ගත යුතුය. (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 3 **v** වගන්තිය)

9. මිය යාම, ඉල්ලා අස්වීම, ධුරයෙන් ඉවත් කිරීම හෝ වෙනත් හේතුවක් මත ධුරයේ පුරප්පාඩුවක් ඇතිවූ විට මසක් ඇතුළත වෙනත් කෙනෙකු පත්කරගත යුතුය. (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 3.**v.**4 වගන්තිය)

10. ජනාධිපතිධුරයේ වැඩ බැලීමේ තනතුර කතානායකට හිමිවේ. මේ නිසා ජනාධිපති බලය අගමැතිවරයා වෙත ලබාගත හැකිවන්නේ නැත. (රටෙන් බැහැරව යන විට හා රෝගාතුරව වීම ආදී හේතු නිසා) (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 8.අ වගන්තිය)

11. ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුවේ වාර අවසන් කිරීමට ඇති බලය අහෝසි වේ. (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 23 අ, ආ, ඇ වගන්ති)

12. රාජ්‍යය විසින් සිදුකරන පත් කිරීම් (තානාපතිවරුන්, මහ කොමසාරිස්වරුන්, පූර්ණාධිකාරී රාජ්‍ය දූතයන්, වෙනත් තානාපති නියෝජිතයින් ආදී) අගමැතිවරයාගේ නිර්දේශ අනුව කැබිනට් උපදේශන යටතේ සිදුකළ යුතුය. (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 5 **iv** වගන්තිය)

13. ජනාධිපතිවරයාට කැබිනට් තීන්දු-තීරණ දැන ගැනීමටත් තම අදහස් කැබිනට් මණ්ඩලය වෙත දැනුම් දීමටත් බලය තිබේ. (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 14 **iii** 8 වගන්තිය)

14. ජනාධිපතිවරයාගේ ලේකම්වරුන්, නිලධාරීන් හා කාර්ය මණ්ඩලය සමන්විත විය යුතු උපරිම ප්‍රමාණය කැබිනට් මණ්ඩලය විසින් තීරණය කරනු ලබයි. විශාල උපදේශක මණ්ඩල මගින් සිදුකරන මහජන මුදල් නාස්තිය අවම වේ. (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 12 වගන්තිය)

15. කොමිෂන් සභාවලට හා ඉහළ නිලතලවලට ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ඉදිරිපත් කරනු ලබන පුද්ගලයින් ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබයි. (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 13 **i** වගන්තිය)

16. ජනාධිපතිවරයා ඉවත් කිරීම (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 9 වගන්තිය)

❖ මන්ත්‍රීවරුන්ගෙන් අඩකට වැඩි ප්‍රමාණයක් පෙත්සමක් (දෝෂාභියෝගයක්) අත්සන් කර දුනහොත් කතානායකවරයා විසින් එය බාරගත යුතු අතර එය පාර්ලිමේන්තුවේ විවාද කොට මන්ත්‍රීවරුන්ගෙන් 2/3ක බහුතරයකින් සම්මත කොට ශ්‍රේෂ්ඨාධිකරණයේ අනුමැතියට යැවිය යුතුය.

❖ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් වරදකරු ලෙස වාර්තාවක් දුනහොත් මන්ත්‍රීවරුන්ගෙන් අඩකට වැඩි ප්‍රමාණයකින් සම්මත විය යුතුය.

## 17. අගමැතිවරයා පත් කිරීම

යම් දේශපාලන පක්ෂයක් විසින් මැතිවරණයේදී අගමැති අපේක්ෂකයා නම් කොට පාර්ලිමේන්තුවේ සම්පූර්ණ ආසන සංඛ්‍යාවෙන් 50%කට වැඩි ප්‍රමාණයක් ලබාගෙන ඇත්නම් ඔහු අගමැති ලෙස ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබේ. 50%කට වඩා බලයක් ලබාගත නොහැකි වූවිට පාර්ලිමේන්තු ඡන්දයකින් අගමැතිවරයා පත්කරගනු ලබයි. (අගමැතිවරයා අනිවාර්යයෙන්ම සරල බහුතරය පෙන්විය යුතුයි.) (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 14 **ii** සහ **iii** වගන්ති)

18. කැබිනට් ඇමතිවරයෙකු, රාජ්‍ය ඇමතිවරයෙකු, නියෝජ්‍ය ඇමතිවරයෙකු ආදී ඇමතිවරයෙකුට එරෙහිව ගෙන එනු ලබන විශ්වාසභංග යෝජනාවක් සම්මත වුවහොත් එම අමාත්‍යධුරය දරන පුද්ගලයා සිය ධුරයෙන් ඉල්ලා අස්වූ බවට සලකනු ලැබේ. (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 17 3 අ වගන්තිය)

19. පාර්ලිමේන්තුවේ පළමු අවුරුදු දෙකක කාලය තුළ අයවැය තුන්වරක් පරාජය වුවහොත් අයවැය පරාජය වූවා සේ සැලකේ. රට තුළ අරාජිකත්වයක් ඇතිවීම වැළැක්වීම මින් සිදුවේ. (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 18 ඇ වගන්තිය)

20. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට එරෙහිව ඔහුගේ පක්ෂය විසින් ගනු ලබන යම් විනය පරීක්ෂණයක් හෝ තීන්දුවක් වාරණයට ලක් කිරීමට අධිකරණයට නොහැකි වේ. එම මන්ත්‍රීවරයාට අසාධාරණයක් වූයේ නම් ඔහුට/ඇයට ශ්‍රේෂ්ඨාධිකරණයේ පිහිට පැතිය හැකිය. පිල්මාරු වැළැක්වීමට මෙය පිටුවහලක් වේ. (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 31 වගන්තිය)

21. අධිකරණයේ දී වරදකරුවෙකු බවට ඔප්පු වූවෙකු සඳහා ජනාධිපති සමාව දීමේ බලය කැබිනට් මණ්ඩලයේ අනුමැතියට යටත් කොට තිබේ. (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 6 වගන්තිය)

22. **අන්තර් කාලීන විධිවිධාන**

❖ දැනට ඇති පාර්ලිමේන්තුව කලින් විසුරුවා හැරීමක් නොවුණහොත් 2020 පෙබරවාරි 08 දින දක්වා ක්‍රියාත්මක වේ. ඉන් පසු විසුරුවා හැරේ. (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 37.අ වගන්තිය)

❖ දැනට සිටින ජනාධිපතිවරයා 2020 ජනවාරි 08 තෙක් එලෙසම ධුරය දරයි. (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 37.ආ වගන්තිය)

❖ ජනවාරි 08න් පසු ඊළඟ පාර්ලිමේන්තු මැතිවරණයෙන් කෙනෙකු පත් කරන තෙක් අගමැතිවරයාට ධුරය දැරිය හැක. (20වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 37 ඇ වගන්තිය)

❖ වත්මන් ජනාධිපතිවරයාද අලුත් ජනාධිපතිවරයෙක් පත් කෙරෙන තෙක් සංශෝධනයට ලක්වූ ජනාධිපතිධුරයේ බලතලවලට යටත්ව ධුරය දරයි.

23. 13වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව ජනාධිපතිවරයාට පැවරී ඇති බලතල සේම නීතියේ මුක්තිය යන කරුණු කිසිදු වෙනසක් සිදු නොවේ. රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් දැනට පවතින ප්‍රතිපාදන එලෙසම පවතී.

## 20වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිධුරය අහෝසි වෙනවාද?

නැත. රටක ආණ්ඩුවේ ප්‍රධාන බලතල වන්නේ ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ යන අංශ තුනයි. මෙහිදී ව්‍යවස්ථාදායකය හෙවත් නීති සෑදීමේ බලය පූර්ණ වශයෙන් අගමැතිවරයා ප්‍රමුඛ පාර්ලිමේන්තුවට ලැබේ.

අනෙක් අතට විධායක බලතල තවදුරටත් ජනාධිපතිවරයා හා කැබිනට් මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වේ. එම නිසා 20වන සංශෝධනය මගින්ද විධායක බලයේ නායකත්වය තවදුරටත් ජනාධිපතිවරයාට ලැබේ. නමුත් වෙනස වන්නේ ජනාධිපතිවරයා සෑම විටම පාර්ලිමේන්තුවේ හා

කැබිනට් මණ්ඩලයේ අවදානයට ලක්වීමයි. එම නිසා ජනාධිපති බලතල හැසිරවීමේදී අත්තනෝමතික වීමට අවස්ථාවක් ජනාධිපතිවරයාට නොලැබේ.

## 20වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජාතික ආරක්ෂාවට තර්ජනයක්ද?

කිසිසේත්ම නැත. 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව රාජ්‍යයේ නායකයා වන්නේ ජනාධිපතිවරයාය. එසේම ජනාධිපතිවරයා විධායකයේ ප්‍රධානියාද වේ. සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයාද වේ. මේ අනුව රාජ්‍යයේ ආරක්ෂාව මූලිකවම ජනාධිපතිවරයාගේ බලතල තුළ තවදුරටත් අන්තර්ගත වේ. රාජ්‍යයට අභ්‍යන්තරිකව හා බාහිරව තර්ජන එල්ල වනවිට ජනාධිපතිවරයාට ක්‍රියාත්මක වීමට බාධාවක් නොමැත. ඔහුට යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීමේ බලතල තවදුරටත් හිමි වී තිබේ.

## 20වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පළාත් සභාවට කුමක් සිදුවනු ඇත්ද?

පළාත් සභාවලට දැනට ලබාදී ඇති බලතල පිළිබඳව හෝ ඒ සම්බන්ධයෙන් කිසිදු වෙනසක් සිදුකිරීමේ යෝජනාවක් 20වන සංශෝධනයේ අන්තර්ගත නොවේ. පළාත් සභා දැනට ක්‍රියාත්මක වන ආකාරයෙන් කිසිදු වෙනසකින් තොරව ක්‍රියාත්මක වන අතර ජනාධිපතිවරයාගේ අනුමැතිය ඇතිව පත්වන ආණ්ඩුකාරවරයා විසින් රජය හා පළාත් සභා අතර පැවතිය යුතු සම්බන්ධය තවදුරටත් එලෙසම පවත්වාගෙන යනු ඇත. වර්තමානයේ පළාත් සභා සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට ක්‍රියාත්මක විය හැකි බලය එලෙසම 20වන සංශෝධනයෙන් පසුවද පවතිනු ඇත. එම නිසා පළාත් සභාවල ක්‍රියාකාරිත්වයට කිසිදු බලපෑමක් කිරීමට 20වන සංශෝධනයෙන් යෝජනා කරන්නේ නැත.

## 20වන සංශෝධනය රට බෙදීමට ගෙන එන යෝජනාවක්ද?

ජාතිවාදී බලවේගයන් විසින් නගන අවලාදයකි. මෙහි කිසිසේත්ම රටට අහිතකර වන අන්දමේ යෝජනා ඇතුළත් නොවන අතර මෙරට දේශපාලන ක්‍රමය පිරිසිදු කිරීමේ අරමුණින් ගෙන එන ප්‍රජාතන්ත්‍රවාදයට පක්ෂ යෝජනාවකි. ආණ්ඩුවේ බලතල නිවැරදි ආකාරයෙන් විද්‍යානුකූලව සකස් කිරීමට ගෙන එන යෝජනාවකි. මෙම යෝජනාව විසින් ජාතිවාදී හා බෙදුම්වාදී බලවේගවල අවශ්‍යතාවයන් ඉටු නොවේ. ජාතික සමගියට එම යෝජනාව අනිවාර්යයෙන්ම දායක වේ. ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව මගින් පත්කරන නිසා එහි සියලුම නියෝජිතයන්ට එම ධුරයට පත්වන පුද්ගලයා පිළිබඳව වගකීමක් පවතී. එම නිසා සිංහල, දෙමළ, මුස්ලිම් ආදී සියලු ජනතා නියෝජිතයන්ගේ අභිමතයට අනුව ජනාධිපති ස්වාධීනව කටයුතු කරයි.

## 20 ගෙන එන්නේ කාගේ වුවමනාවකටද?

මෙය නිරන්තරයෙන්ම නැගෙන ප්‍රශ්නයකි. සැබවින්ම 20වන සංශෝධනය මගින් යෝජනා වී ඇති ආකාරයට ජනාධිපතිවරයාගේ අත්තනෝමතික බලය සමනය කිරීමේ අවශ්‍යතාවය 1978 ව්‍යවස්ථාව හඳුන්වා දුන් යුගයේ සිට අද දක්වාම පවතී.

❖ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විධායක ජනාධිපතිධුරයට එරෙහිව කටයුතු කළාය.

❖ 1994 බලයට පත්වන විට චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රධාන දේශපාලන පොරොන්දුව වූයේ විධායක ජනාධිපතිධුරය අහෝසි කිරීමයි.

❖ මහින්ද රාජපක්ෂ මහතාගේ 2005 මහින්ද චින්තනය තුළද 2010 මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළද විධායකයේ අත්තනෝමතිකභාවය පිළිබඳව මනාව විග්‍රහ වී ඇති අතර එය ජනතාවාදී ලෙස ප්‍රතිසංස්කරණයට ඔහු එකඟ වුණි.

❖ 2015 මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ ප්‍රධාන සටන්පාඨය වූයේද, මාදුළුවාවේ සෝභිත හිමියන්ගේ අපේක්ෂාව වූයේද සිවිල් සාමාජිකයින්ගේ අපේක්ෂාව වූයේද "විධායකය" ජනාධිපතිවරයාගේ

අත්තනෝමතිකභාවයෙන් බේරා ගැනීමය; නැතිනම් අහෝසි කිරීමය.

❖ මෙරට සියලු දේශපාලන පක්ෂ (සුළු ජාතිකවාදී කණ්ඩායම් කිහිපයක් හැර) හා සිවිල් සංවිධාන, කම්කරු බලවේග, විශ්වවිද්‍යාල බුද්ධිමතුන්, වෘත්තිකයන් සියලු දෙනාම මෙම ප්‍රජාතන්ත්‍ර විරෝධී බල ව්‍යුහය ප්‍රතිසංස්කරණය කිරීමට සිය එකඟතාවය පළකොට ඇති අතර ඒ වෙනුවෙන් සටන් කොට තිබේ.

එම නිසා 20වන සංශෝධනය ගෙන එන්නේ ජනතාවගේ අපේක්ෂාව දිනවීමට හා ලංකාව දියුණු ප්‍රජාතන්ත්‍රවාදයක් සහිත රටක් බවට පත් කිරීමටයි.

## 20 සම්මත වීමෙන් පසුව රට තුළ මතුව ඇති සියලු ප්‍රශ්නවලට විසඳුම් ලැබේද?

කිසිසේත්ම නැත. නමුත් 20වන සංශෝධනය තුළින් ජනතාවාදී පාලනයක් ගෙන යාමේ පද්ධතියක් සකස් කර ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත. ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වනු ඇත. ප්‍රධාන වශයෙන්ම 20වන සංශෝධනයෙන් අනතුරුව

ජනාධිපතිවරයාට දූෂිත ක්‍රියාකාරකම්වල යෙදීමට අවස්ථාව නොලැබේ.

ජනාධිපතිවරයාට ඥාති සංග්‍රහ කිරීමට අවස්ථාව නොලැබේ.

ජනාධිපතිවරයාට ගජ මිතුරු ධනවාදයට සේවය කිරීමේ අවස්ථාව නොලැබේ.

ජනාධිපතිවරයාට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බිලි බා ගැනීමට නොහැකි වේ.

ජනාධිපතිවරයාට ආණ්ඩු විරෝධී කුමන්ත්‍රණ දියත් කිරීමට නොහැකි වේ.

ජනාධිපතිවරයාට රාජ්‍ය සම්පත් තම අභිමතය පරිදි විදේශිකයන්ට පැවරීමට නොහැකි වේ.

ජනාධිපතිවරයාට රාජ්‍යයට අවාසිසහගත ගිවිසුම්වලට එළඹීමට නොහැකි වේ.

ජනාධිපතිවරයාට ජාතික ආරක්ෂාවට තර්ජනය වන ආකාරයේ ක්‍රියාමාර්ගවලට (ත්‍රස්තවාදීන්ට ආයුධ හා මුදල් දීම වැනි) එළඹීමට නොහැකි වේ.

ජනාධිපතිවරයාට අධිකරණයේ ස්වාධීනත්වයට ගරු කිරීමට සිදුවේ.

ජනාධිපතිවරයාට මාධ්‍ය නිදහසට අත තැබීමට නොහැක. (ඔහු ආණ්ඩුවේ නායකයා නොවන නිසා හා ඔහුගේ බලය පාර්ලිමේන්තුව මගින් ලැබී ඇති නිසා ජනතාවගේ නිදහස හා මාධ්‍ය නිදහස වඩාත් ප්‍රවර්ධනය වනු ඇත.

ජනාධිපතිවරයාට ස්වාධීන කොමිෂන් සභාවලට අනවශ්‍ය ආකාරයේ ඇඟිලි ගැසීමේ බලය නොලැබේ.

සමස්තයක් ලෙස වංචාව, නාස්තිය හා දූෂණය හා ව්‍යවස්ථා විරෝධී කටයුතු සිදු කිරීමට වත්මන් ව්‍යවස්ථාව මගින් ලබාදී ඇති අත්තනෝමතික බලතල ජනාධිපතිවරයාගෙන් ඉවත්වන නිසා ජනාධිපතිධුරය මෙරටට හිතකර ජනතාවාදී පාලනයකට මඟ පෙන්වන ආයතනයක් වශයෙන් වර්ධනය වනු ඇත.

## 20 නිසා අගමැතිවරයාට අත්තනෝමතික ලෙස ක්‍රියා කිරීමේ බලය ලැබෙනවාද?

20වන සංශෝධනයට අනුව ආණ්ඩුවේ ප්‍රධානියා හා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වන්නේ අග්‍රාමාත්‍යවරයායි. අග්‍රාමාත්‍ය ධුරයට පුද්ගලයෙකු මැතිවරණයට පෙර නම්කළ හැකි අතරම මැතිවරණයෙන් පසුව පාර්ලිමේන්තුවේ බහුතර ආසන සංඛ්‍යාවෙන් විශ්වාසය දිනා ගන්නා (50% හෝ ඊට වැඩි) පුද්ගලයා අගමැතිවරයා වශයෙන් පත් වේ. මෙම නිසා අගමැතිවරයා ව්‍යවස්ථාදායකයේ ප්‍රධානියා වීම සිදුවේ. අනෙක් අතට අගමැතිවරයා නිරන්තරයෙන්ම පාර්ලිමේන්තුවේ බහුතරය මත යැපෙන පුද්ගලයෙකි. ඔහු තම පක්ෂයේ බහුතර බලය ලබාගෙන අත්තනෝමතික වීමට කටයුතු කළොත් පාර්ලිමේන්තුවට විශ්වාසභංග යක් සරල බහුතරයෙන් යෝජනා කොටගෙන ඔහුට විරුද්ධ වීමේ අයිතිය ලැබේ. අගමැතිවරයාට කිසිසේත්ම වත්මන් ජනාධිපතිවරයා පරිදි

අත්තනෝමතිකව හැසිරීමට පාර්ලිමේන්තු ක්‍රමයක් තුළදී නොහැකි වේ. එහිදී ජනාධිපතිවරයා සතුව පවතින රාජ්‍ය බලය හා අධිකරණය සතු ස්වාධීනත්වය හා කැබිනට් මණ්ඩලය සතු බලය සේම පාර්ලිමේන්තුවේ පරමාධිපත්‍ය බලයටද යටත්ව අගමැතිවරයාට ක්‍රියා කිරීමට සිදුවනු ඇත.

සැබැවින්ම ඕනෑම ව්‍යවස්ථාවක් සාර්ථක වන්නේ එය ක්‍රියාත්මක වන ආකාරය අනුවය. එසේම 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තුලනය වන හා සංවරණය වන ආණ්ඩුවේ බල ව්‍යූහය ක්‍රියාත්මක කිරීම සඳහා රටට ආදරය කරන පාලක පිරිසක් පත්කර ගැනීමට ජනතාව ක්‍රියාත්මක විය යුතුය.

20වන සංශෝධනයත් සමඟ ජනතාවට දේශපාලනික වශයෙන් ඉතාමත් බුද්ධිමත්ව තම නියෝජිතයින් තෝරා පත්කර ගැනීමේ අවස්ථාව හිමිවේ. මන්ද, තමන් පත්කර ගන්නා බුද්ධිමත් දේශපාලන නියෝජිතයා විසින් ව්‍යවස්ථාදායක (පාර්ලිමේන්තු) විධායක (ජනාධිපති) යන ක්ෂේත්‍ර දෙකටම බලපාන අන්දමින් ක්‍රියා කිරීමේ වැඩි අවස්ථාවක් හිමිවේ.

තවදුරටත් ජනතා නියෝජිතයින්ට ජනාධිපතිවරයාගේ සුවච කීකරු ගෝලයන් වීමට හෝ අග්‍රාමාත්‍යවරයාගේ අතකොළු වීමට අවශ්‍ය නොවේ.

අවසන් වශයෙන් කිව යුත්තේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ පූර්ණ බලය ඇත්තේ ජනතාව වෙත බවය. ජනතාව පත්කර ගත යුත්තේ වඩාත් යහපත් නියෝජිතයින් මිස දූෂිතයින් නොවේ. මෙරටට යහපත් දේශපාලන සංස්කෘතියක් ඇති කිරීමේ වගකීම ඇත්තේද මෙරට ජනතාවටම බව අපි අවධාරණය කරමු. එබැවින් ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියලු දෙනාගේ වගකීම වනුයේ 20වැනි සංශෝධනය පිළිබඳ බොරු බියක් ඇති කරගන්නවා වෙනුවට එහි අඩුපාඩු තිබේනම් ඒවා සකස් කිරීමටද දායක වෙමින් මෙම ජනතා අපේක්ෂාව දිනවීමට දායක වීමයි.

# ජනතා විමුක්ති පෙරමුණ

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාර, 464/20, ස්ථානයේ පදිංචි උපුල් රන්ජන් වන මා විසින් මහරගම, පිළියන්දල පාර, නුගගහ පෙදෙස, 43/20 ස්ථානයේ පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයෙහි මුද්‍රණය කරවන ලදී.

464/20, Pannipitiya Road, Pelawatta, Battaramulla, Sri Lanka.
Tel : +94 112 785612, +94 112 786355 Fax : +94 112 786050
**e-mail**: jvp@jvpsrilanka.com **Web:** www.jvpsrilanka.com, www.jvp.lk **FB:** www.facebook.com/jvpsrilanka